**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2025**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ (“විශ්වවිද්‍යාලය”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි විශ්වවිද්‍යාලයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය .කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ 7.4 වගන්තිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කරන්නේ නම් ඒ සඳහා භාණ්ඩාගාරය වෙතින් විධිමත් අනුමැතියක් ලබා ගත යුතු වුවද, එසේ විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2023 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි ලේඛකාධිකාරිගේ නිල නිවාසය සඳහා අයවිය යුතු රු.320,134 ක ජල, විදුලි බිල්පත් ගාස්තු 2025 වර්ෂයේ දී කපා හැර තිබුණි. | විශ්වවිද්‍යාලයේ හිටපු ලේඛකාධිකාරී වෙත නිල නිවස භාරදීමේ දී හෝ ඉන් පසුව ජල, විදුලි ගාස්තු ගෙවිය යුතු බවට දන්වා නොමැති බැවින් හා එතෙක් නිල නිවාසය භාවිතා කළ ලේඛකාධිකාරිවරුන්ගෙන් ජල, විදුලි ගාස්තු අය කර ගැනීමක් සිදු කර නොතිබීමත්, නිල නිවාස හෝ නේවාසිකාගාරවල වාසය කරන කිසිදු නිලධාරියෙකුගේ ජල, විදුලි ගාස්තු වෙන වෙනම අය කිරීමට කටයුතු කර නොතිබීමත් යන හේතූන් මත හිටපු ලේඛකාධිකාරී නිල නිවාසය භාවිතා කළ 2023 ඔක්තෝබර් 11 දින සිට 2025 ජනවාරි 11 දින දක්වා වූ කාලය සඳහා ජල, විදුලි ගාස්තු අය කර නොගැනීමට කටයුතු කර ඇති බව. තවද, 2025 අගෝස්තු මස සිට නිල නිවාස හෝ නේවාසිකාගාරවල නේවාසික සියලු නිලධාරීගෙන් ජල, විදුලි ගාස්තු අය කිරීමට කටයුතු යොදා ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ විධිවිධාන අනුව නිල නිවාස භාවිතා කරන්නන් විසින් ජල හා විදුලි ගාස්තු ගෙවිය යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 ඡේදයේ i වගන්තිය | විගණිත දිනය වූ 2026 අප්‍රේල් 20 දින වන විටත් 2025 වර්ෂයට අදාළව පුස්තකාල කෘති සමීක්ෂණය සිදු කර නොතිබූ අතර, 2024 පුස්තකාල කෘති සමීක්ෂණයට අනුව පුස්තකාල පොත් 213 ක් අස්ථානගත වී තිබුණි. | (i) වාර්ෂික සංගණනයක් සඳහා පාලක සභා අනුමැතිය හිමිවීමේ සිට අවසන් වාර්තාව පාලක සභාව වෙත යොමු කොට නිර්දේශ ක්‍රියාත්මක කිරීම අනුමත කර ගැනීමට මාස 13 ත් 15 ත් අතර කාලයක් ගත වන බව.<br>(ii) පරිග්‍රහණ ලේඛණයට ඇතුළත් කර නොතිබුණු කෘති පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කොට ඇති බව හා ඉන් බහුතර කෘති සංඛ්‍යාවක් විධිමත් පරිදි අපහරණ ක්‍රියාවලියට ලක්කොට ඇති බවට පුස්තකාලයාධිකාරී විසින් සිදුකළ අහඹු පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂිකව කෘති සමීක්ෂණය සිදු කිරීමෙන් පුස්තකාල පොත් අස්ථානගත වීම් හඳුනාගෙන එවැනි අවස්ථා වළක්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ප්‍රමාදයකින් තොරව ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.158,266,028 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,531,611 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.154,734,417 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.198,623,943 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 2.84:1 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දී එය 1.92:1 ක් ලෙස අඩු වී තිබුණි. ක්ෂණික වත්කම් අනුපාතය 1.29:1 සිට 1.58:1 දක්වා වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නිෂ්කාර්ය ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා 25 නමකට නේවාසික පහසුකම් | විදේශීය ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය වෙත ආකර්ෂණය කරගැනීම සඳහා | ශිෂ්‍ය නේවාසිකාගාරය සම්පූර්ණ ලෙස |

| | | |
|---|---|---|
| සැපයීමේ අපේක්ෂාවෙන් රු.80,843,406 ක් වැය කර ශිෂ්‍ය නේවාසිකාගාරයක් ඉදිකර තිබුණ ද, විදේශ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කිරීමට අපොහොසත් වීම සහ මෙම ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හේතුවෙන් මෙම නේවාසිකාගාරයේ මුළු කාමර ධාරිතාවයෙන් සියයට 56ක් නිශ්කාර්යය මට්ටමේ පැවතුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් පවතින බව. | භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු රු.මිලියන 08 ක වටිනාකමින් යුත් සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතියේ (ERP) වැඩ 2025 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණු නිසා ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැයකර තිබුණු රු.4,000,000ක මුදලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | 2025 ඔක්තෝබර් 16 දින මෙම පද්ධතිය විශ්ලේෂණය කිරීම සඳහා පත් කළ ජාතික විද්‍යා පදනමේ තොරතුරු නිලධාරී විසින් වාර්තා කර තිබූ දෝෂ අදාළ ආයතන වෙත දැනුම් දීමට කටයුතු කල බවත්, ඒ අනුව එම දෝෂ නිරාකරණය කිරීමට පියවර ගෙන තිබුණු බවත්, මේ වන විට ERP පද්ධතිය මඟින් බොහෝ අංශ රාජකාරි කටයුතු සිදු කරමින් පවතින බවත්, එහිදී ඇතිවන යම් යම් දෝෂ හඳුනාගෙන එම දෝෂ පිළිබඳ වාර්තා ද අදාළ ආයතන වෙත දැනුම්දීමට කටයුතු කර ඇති බවත් හා එම කටයුතු කඩිනමින් අවසන් කර විශ්වවිද්‍යාලය වෙත භාර දෙන බව අදාළ ආයතනයේ නියෝජිතයින් විසින් වාචිකව දන්වා ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ නිම කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |